

# ඉන්ද්‍රජාලික වනපෙත

දෙහන්සා මෙතුම්ලී සුදුහුම්පොල

# ඉන්ද්‍රජාලික වනපෙත

S.M.G. දෙහන්සා මෙතුම්ලී සුදුහුම්පොල

# ඉන්ද්‍රජාලික වනපෙත

S.M.G. දෙහන්සා මෙතුම්ලී සුදුහුම්පොල

**කතෘගේ වෙනත් කෘති**

***අපූරු තෑග්ග***

***ඇන්තූරියම් මලේ කතාව***

**මහාමායා බාලිකා විදුහල**

**9 ශ්‍රේණිය** G

**2026-**

---

© S.M.G. දෙහන්සා මෙතුම්ලී සුදුහුම්පොල

ISBN 978-624-211-425-5

# පිදුම

**මා හට සිප්සතර කියා දෙමින්,**

**මගේ දැනුම සහ ජීවිතය හැඩගස්වන**

**මගේ ආදරණීය සිප්හල වන මහනුවර**

**මහාමායා බාලිකා මාතාවටත්,**

**මගේ හීනවලට පියාපත් දෙමින් මා පිටුපසින්ම**

**හිඳින මගේ ආදරණීය අම්මා, අප්පච්චී, නංගි, අත්තම්මා,**

**ඇතුළු  පවුලේ සැමටත්,**

**ජීවිතයේ සෑම මොහොතකම මා දිරිමත් කරමින්,**

**නිර්මාණශීලී ගමනකට**

**නිහඬවම ශක්තියක් වූ මගේ ළඟම මිතුරියන්ටත්,**

**මේ පිටු අතර අතරමං වෙමින් මගේ සිතුවිලි**

**විශ්වයට ආදරය කරන,**

**ලේඛන කලාවේ ජීවය වන මගේ සෙනෙහබර**

**පාඨක ඔබටත්,**

**මගේ සිත් අහසේ පිපුණු,මේ පුංචි මල**

**මෙසේ පුද කරමි.**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# සිතියම

ඔන්න එකෝමත් එක රටක ලස්සන ම ලස්සන කැලෑවක් තිබුණා.මේ කැලෑව ඉතාමත් සුන්දර යි. මේ කැලෑවේ ගොඩක් සත්තු ජීවත් වුණා. දිය ඇළි, මුහුදු වගේ පොකුණු වලින් මේ කැලෑව සමන්විතයි. ඒ වගේ ම මේ ලොකුම ලොකු කැලෑව විශාල කඳුවැටියකින් වටවෙලයි තියෙන්නේ. මේ කැලෑව සාමාන්‍ය කැලෑවක් නම් නෙවෙයි.  ඇයි දන්නවා ද? මේ කැලෑවේ ජීවත්වෙන සතුන්ට අපූරුවට කතා කරන්න පුලුවන්.

මේ කැලෑව කඳුවැටියකින් වටවෙලා තිබුණ නිසාත් කැලෑව ගැන කවුරුත් දැනන් හිටියේ නැති නිසාත් මේ වනපෙත ලෝකයෙන් හැංගිලා තිබුණ  සතුන්ට සුරක්ෂිත ව ජීවත් වෙන්න පුලුවන් ස්ථානයක් වුණා.



ඉතින් මේ වනාන්තරයට එපිටින් පිහිටි නගරයේ ඩේවිඩ් කියලා මනුස්සයෙක් ජීවත් වුණා . ඩේවිඩ් කියන්නේ නිධන් හාරන්නෙක්. දවසක් ඩේවිඩ් පොතක් කියවනකොට ඒක ඇතුලේ තිබිලා මුළු පළාතම ඇතුළත් වෙන විදිහට ඇඳපු සිතියමක් හම්බවුණා .




.

මේ පොත ඩේවිඩ් ගොඩක් පරිස්සම් කළ පොතක්. මොකද මේ පොත ඩේවිඩ්ගේ අත්තලා, මුත්තලා, නත්තලා, පනත්තලා, කිරිකිත්තලා, මීමුත්තලා ගෙන් පස්සේ තමයි ඩේවිඩ්ට හම්බවෙලා තියෙන්නේ. මේ පොතේ ලෝකයේ නිදන් වස්තු ගැනයි ලියවිලා තිබුණේ.

ඉතින් පොත ඇතුලේ තිබිලා හම්බවුණු මේ සිතියමේ නගරයත් ඊට එපිටින් තිබෙන කඳුවැටියත් සලකුණු කරලා තිබුණා. ඩේවිඩ් මීට කලින් මේ කඳුවැටියට එහායින් තියෙන්නෙ මොනවද කියලා දැනගෙන හිටියේ නැහැ. ඒ වුණාට මේ සිතියමේ කඳුවැටියට එපිටින් ලොකු වනාන්තරයක් සලකුණු කරලා තිබුණා. කැලෑවේ මැද හරියේ ලොකු පර්වතයක කතිරයක් සලකුණු කර තිබුණා. ඒ ළඟින්ම පුංචි නිධන් පෙට්ටියකුත් ඇඳලා තිබුණා.

ඉතින් ඩේවිඩ් ට එකපාරට ම ඔලුවට ආපු අදහස මොකක්ද කියලා මම අමුතුවෙන් කියන්න ඕනේ නැහැනේ. මොකද ඔයාලා දන්නවා මේ පර්වතය ඇතුළේ නිධානයක් තියෙනවා කියලා ඩේවිඩ්ට හිතුණු බව. ඒ අදහස තවත් තහවුරු වුනේ සිතියමේ පිටුපස ලියලා තිබුණු වාක්‍යයක් නිසා. සිතියමේ ලියල තිබුණා, **"මෙය මාගේ අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසායි."** කියලා.

ඒ කියන්නේ ඩේවිඩ්ගේ පරපුරේ කෙනෙක් මේ කැලෑව ගැන දැනගෙන ඉඳලා තියෙනවා කියන එකනේ. නමුත් දැන් ඩේවිඩ් මේ කැලෑව ගැන දැනගත්තත් මේ කැලෑව ගැන දැනගෙන ඉඳලා තියෙන්නේ ඩේවිඩ් ගේ පරම්පරාවේ අය විතරයි. ඩේවිඩ් ට සිතියම හම්බවුණා ට පස්සේ රෑට කන්න මතකත් නැහැ. ඒ තරමම සතුට.

ඔන්න ඉතින් උදේ පාන්දරම නැගිට්ට ඩේවිඩ් බඩුමලු අහුරන්න පටන් ගත්තා. මගේ දෙවියනේ ! මටනම් එහෙම හිතුණා මෙයාගේ බඩු ලැයිස්තුව දැක්කාම.
මේ බලන්න මීටර් තිහක් දිග ලණුවක්, ලී කපන කියතක්, ඇණ ගලවන්න අඬුවක්, පෑන පිහියක්, වතුර ලීටර් 20 කෑන් එකක්, ඇසුරුම් කළ ආහාර තොගයක්, කමිස දෙකක්, කලිසම් දෙකක්, මාලිමාවක්, අත් ඔරලෝසුවක්, අකුලන කූඩාරමක්, අකුලන මෙට්ටයක් හා කොට්ටයක්. ඇති යන්තම්! ඔයාලට බඩු ලැයිස්තුව කියන මේ මටත් දැන් මහන්සියි!

ඉතින් දැන් දවස් තුනක් තිස්සේ ඩේවිඩ් බඩු හොය හොයා බෑග් මලුවලට ඔබනවා, සුපිරි වෙළඳසැලට ගිහින් බඩු මිලදී ගන්නවා, වඩු කර්මාන්තශාලාවට ගිහින් උපකරණ මිලදී ගන්නවා, අලුත් ඇඳුම් අරගන්නවා, වැඩ ගොඩයි !

# කලබලේ

ඉතින් දැන් ඩේවිඩ් ගියේ තමන් වැඩිපුර ම ආදරය කරන, මේ ලෝකයේ තමන්ගේ නෑදෑයෙක්ට කියලා ඉතුරු වෙලා ඉන්න එයාගේ එකම නංගි හොයාගෙන. ඒ තමන්ගේ පිටත් වීම ගැන නංගීට කියන්න. ඩේවිඩ් තමන්ගේ නංගී ජීවත් වූ නිවසට ගියා. නංගීට දැන් අවුරුදු විස්සයි. එයාගේ නම ජේන්.

" හලෝ ජේන් ඔයාට කොහොමද? මම ඔයාට දෙයක් කියන්නයි ආවේ."දොරට තට්ටු කළ ඩේවිඩ් කිව්වා.

නංගී ජීවත් වෙන්නේ ඇයගේ හොඳම මිතුරිය කැත්ලීන් එක්ක. ඇය තමන්ගේ අයියාට ගොඩක් ආදරය කළා. ඩේවිඩ්ගේ හා ජේන්ගේ මවුපියන් රිය අනතුරකින් මියගියේ ජේන්ට වයස අවුරුදු පහේ දී. ඉතින් එදා ඉඳලා තමාව ආදරයෙන් රැක බලා ගත් අයියාට ඇය ගොඩක් ආදරය කළා. සතියකට වරක් තමාව මුණගැසෙන්න එන ඩේවිඩ් වෙනුවෙන් ම ඇය රසවත් ආහාර පිළියෙල කොට තැබුවේ ඇයගේ අතින් සාදන ආහාර වලට තම අයියා දැඩි රුචිකත්වයක් දක්වන බව දන්න නිසාමයි. ඩේවිඩ් සහ ජේන් අතර අවුරුදු හතක පරතරයක් තිබුණා.

" අනේ අයියේ , මම හොඳින් අයියට කොහොමද? එන්න අයියේ, ඇවිත් වාඩි වෙන්න. මම විනාඩියෙන් එන්නම්." යැයි පැවසූ ජේන් මුළුතැන්ගෙය වෙත දිව ගියේ උතුරා යන ප්‍රීතියකින්.

මේ වෙලාවේ කැත්ලීන් ගෙදර හිටියේ නැහැ. ඉතින් අයියා ආසම පොල් කේක් පිරවූ බන්දේසියක් සමඟ උණු චොක්ලට් කෝප්ප දෙකක් අතින් ගත් ජේන් සාලයට ආවා.

" මෙන්න මම අයියාටම කියලා හදපු පොල් කේක්. උණු චොකලට් කෝප්පයත් බොන්න. මේ සීතල කාලේ උණු චොක්ලට් ටිකක් උගුරෙන් පල්ලෙහාට වැටුනාම කිසිම ප්‍රශ්නයක් ඔලුවට එන්නේ නැහැ." තම චොකලට් කෝප්පය තොල ගාමින් ජේන් කිව්වා.

" නංගි මම මේ කියන්න හැදුවේ....."ඩේවිඩ් ඉතුරු ටික ගිල ගත්තා.

"මොකක්ද අයියේ ප්‍රශ්නේ?" ජේන්ට තේරුණා ඩේවිඩ් කියන්න යන්නේ බරපතල දෙයක් කියලා. එයා චොකලට් කෝප්පය පැත්තකින් තියලා පුටුව උඩ හොඳට හරිබරි ගැහිලා වාඩි වුණ

" කියන්නකො අනේ"

" හොඳයි.....ජේන් මට ටික කාලයකට ගමෙන් පිට යන්න වෙනවා"

“මොනවා!......ඒත්....කොහාටද?” ජේන්නම් දැනටමත් කලබල වෙලා. හොඳ වෙලාවට කෝප්පය පැත්තකින් තිබ්බේ. නැත්නම් මෙයා උඩ පැන්න තරමට කෝප්පයේ කෑලිවත් හොයාගන්න වෙන්නේ නැහැ.

“ අපොයි ජේන්, ඔයා දැනටමත් කලබල වෙලානේ. ඉතින් මං කොහොමද කියන්නේ බබෝ?” ඩේවිඩ් බුම්මාගෙන කිව්වා.

“ හරි හරි ඉතින්, අයියා කියන්නකෝ මම කලබල වෙන්නේ නෑ.”

“ මෙහෙමයි..... මම.... නගරයට එහා පැත්තේ තියෙන.... කඳුවැටියෙන්....වට වෙලා තියෙන කැලෑවට යනවා.” ඩේවිඩ් ඇදලා පැදලා කිව්වා.

“ මොන කැලෑවද දෙයියනේ? මම නම් එහෙම එකක් ගැන දන්නේ නෑ.” ජේන් දැන් නම් ටිකක් බය වෙලා. ඔන්න එතකොටම ඇරිලා තිබුණු දොරෙන් කැත්ලීන් ඇතුළට ආවා.

“ හලෝ ඩේවිඩ් අයියේ, මම මේ පොළට ගියා බඩු ටිකක් ගන්න. කුස්සියේ එළවළුවකට තිබුණේ කැරට් විතරයි. දැන් නම් ඉතින් පෙට්ටි පිරෙන්න එළවළු පලතුරු තියනවා.” සීතකබාය ගලවලා දාලා කැත්ලීනුත් පොල් කේක් කෑල්ලක් කන්න හිතාගෙන ජේන් ගාවින්ම වාඩිවුණා.



" අනේ කැත්, මේ බලන්නකෝ අයියා කියන කතාව." ඉතින් ඩේවිඩ් එයාට ලැබුණු සිතියම ගැනත් ඒ සිතියමේ සඳහන් වුණු නිධානය ගැනත් සම්පූර්ණ විස්තරය කිව්වා.

"අනේ අයියේ, ඔයා දන්නවනේ මං ඔය නිදන් හාරන වැඩවලට කැමති නෑ කියලා."ජේන් මූණ ඇඹුල් කරගත්තා.

"ඒකට නම් මාත් එකඟයි ජේන්. අනිත් එක ඔය කැලෑ අස්සේ රිංගනකොට කැලෑ සත්තු ගොඩක් එක්ක හැප්පෙන්න වෙයි. ඒක හිතන තරම් ලේසි නෑ." කැත්ලීන් කිව්වා.

"ඒකට කමක් නෑ. ඔයාලා මං එනකම් පරිස්සමින් ඉන්න. ඒක තමයි මට ඔයාලාගෙන් ලැබෙන ලොකුම තෑග්ග. ඔයාලාට පුළුවන්ද මට ඒ තෑග්ග දෙන්න?" ඩේවිඩ් ඇසුවා.

" ඒත් අයියේ….." ජේන් ඩේවිඩ්ව බදාගෙන අඬන්න ගත්තා.

" ඔන්න ඔන්න ඔයා බබෙක් වෙනවනේ. මම එහේ පදිංචි වෙන්න යනවා නෙමෙයිනේ ජේන්. දැන් ඉතින් හොඳ ළමයා වගේ ඉන්නකෝ අඬන්නේ නැතුව."

" ඒක තමයි ජේන්. ගමන පටන් ගන්නත් කලින් ඔයා ඔහොම ඇඬුවාම අයියාට දුක හිතෙනවනේ." දුකෙන් උනත් ජේන්ව සනසන අටියෙන් කැත්ලීන් කිව්වා.

" මට ජේන හැටියට ඩේවිඩ් අයියා ගිහින් එනකල් මට ජේන්ව සනසවමින් තමයි ඉන්න වෙන්නේ." කැත්ලීන්ගේ සිනාමුසු මුහුණ දුටු ජේන් කඳුළු අතරින් යම්තම් හිනාවුණා.

" හරි අපි මෙහෙම වැඩක් කරමුකෝ. ඔයා ගොඩක් ආසයිනෙ පොත් කියවන්න. ඒක නිසා මම නිධානේ හොයාගත්තට පස්සේ අපි එකතුවෙලා පුස්තකාලයක් ඉදි කරමු." ඩේවිඩ් කිව්වා.

" ඒ අදහසට නම් මම උඩින්ම එකඟයි අයියේ. ඔයාට පුළුවන්නම් හෙට වෙනකල් ගමන කල් දාන්න, අපිට පුළුවන් රස කෑම ටිකක් හදලා දෙන්න නේද කැත්?" ජෙන්ගෙ මුහුණේ කඳුළු දැන්නම් වේලිලා.

"එහෙනම් මම හෙට එන්නම්කෝ ඔයාලගේ රස කෑම ගෙනියන්න" එහෙම කියූ ඩේවිඩ් ගෙයින් එළියට බැස්සා.

" කැත් මං හිතන්නේ දැන් අපි දෙන්නා ආයෙත් පොළට ගියොත් හොඳයි, නැත්නම් අපිට බඩු මදි වෙයි කෑම හදන්න."

# සමුදීම

ඊළඟ දවසත් උදා වුණා. ඩේවිඩ් විශාල බෑග්මලු තුනක් හතරක් එල්ලාගෙන ජේන් ගේ නිවස වෙත ගියා.

" Good morning ජේන්! කෝ ඔයා කියපු කෑම හැදුවද?"

" ඔව් අයියේ. මම හිතනවා ඔයාට මේ බටර් කේක්, චොකලට් කප්කේක්, කොෆී කේක්, මුද්දරප්පලං බනිස්, චොකලට් බ්‍රව්නීස් සහ ඔයා කැමතිම පොල් කේක් ඇතිවෙයි කියලා." ජේන් පාර්සල් කළ ආහාර පෙන්වමින් කිව්වා.

" මට ජේන විදිහට මේ ටික ගෙනියන්න තවත් මල්ලක් හොයාගන්න වෙයි වගේ."

එයට පිළිතුරු ලෙස සිනාසුණු ජේන් මෙහෙම ඇහුවා. " අයියා ගිහින් එන්නේ කවදාද?"

" මෙහෙමයි ජේන්, අඩුම තරමේ සති දෙක තුනක්වත් යයි. මොකද ඉතින් මහා විශාල කන්දක් පහු කරන්නත් එපැයි. ඒත් මං පොරොන්දු වෙනවා පුළුවන් ඉක්මනට ආපහු එනවා කියලා." ඩේවිඩ් ආහාර පාර්සල් ටික තම ගමන් මලුවලට ඔබා ගන්නට උත්සාහ කරමින් කිව්වා.

"එහෙනම් ඔන්න මම ගියා. මං එනකම් පරිස්සමින් ඉන්න."ඩේවිඩ් කැත්ලීන් ට සහ ජේන් ට අත වැනුවා.

" සුබ ගමන් අයියේ ! පරිස්සමින් ගිහින් එන්න." ජේන් සිනාමුසු මුහුණින් ඩේවිඩ් ට අත වැනුවා. නමුත් ඇය දෙස බැලූ කැත්ලීන් ට සිතුණේ තම මිතුරිය යම් චකිතයකින් යුතුව ඩේවිඩ්ට අත වැනූ බවයි.



# පළමු දවස

ඩේවිඩ් බෑග්මලු ටිකත් අත් කරත්තයට දමාගෙන යන්න පිටත් වුණා. නගරය පහු කරලා කන්ද නගින්න පටන් ගත්තා. සෑහෙන වේලාවක් කන්ද නැග්ග ඩේවිඩ් දිවා ආහාරය සඳහා සුදුසු තැනක් හොයාගෙන ඉඳගත්තා.

" හ්ම්....මොනවාද මට කන්න තියෙන්නේ?" තම ගමන් මලු අතරින් විශාලම ගමන් මල්ල වුණු කෑම මල්ල අදිමින් ඩේවිඩ් හිතුවා. ඔහුගේ රසවත් දිවා ආහාරයට සාඩින්, පෙතිපාන්, ස්ට්‍රෝබෙරි ජෑම් සහ ජේන්ගේ රසවත් චොකලට් කප්කේක් ඇතුළත් වුණා.

" බඩ පැලෙන්න කෑවා. දැන් ඉතින් ටිකක් නිදා ගන්නයි තියෙන්නේ" ඉතින් ඩේවිඩ් ගහකට ඇලවෙලා පැය දෙකක් විතර හොඳට නිදා ගත්තා. ඊට පස්සේ අවදිවුණු ඩේවිඩ් ට හිතුනේ "දැන්නම් ඕන තරම් දුර කඳු නගින්න පුළුවන්." කියලයි. ආයෙත් ඉතින් අර අත් කරත්තයත් තල්ලු කරගෙන කන්ද නඟින්න පටන් ගත්තා. කොහොමින් කොහොමහරි කන්දේ බාගයක් විතර දුර නැග ගන්න එයාට පුළුවන් වුණා.

" දැන් නම් හවස් වේගෙන එන හැඩයි. හවස හය වෙනවා මට නම් දැනුනේවත් නැහැ. දැන් ඉතින් කරන්න තියෙන්නේ නිදාගන්න හොඳ තැනක් හොයාගන්න එකයි. හ්ම්..... ආ....මේ තියෙන්නේ හොඳ තැනක්." මහා විශාල ඕක් ගහක් යට සෙවණැති ස්ථානයක් පෙන්වමින් ඩේවිඩ් තමාටම කියා ගත්තා.

"ඉක්මනට කූඩාරම අටවා ගන්න ඕන." ඩේවිඩ් කූඩාරම අටවා ගෙන ගිනිමැළ දෙකකුත් පත්තු කළා.

"දැන් ඉතිං සත්තු මං ළඟට එන එකකුත් නැහැ. හ්ම්.....මට හරිම මහන්සියි. දැන් කරන්න තියෙන්නේ කෑම කාලා හොඳට නිදාගන්න තමයි."
මේ විදිහට ඩේවිඩ් ගේ චාරිකාවේ පළමු දවස ගෙවිලා ගියා.

"ට්‍රිලිං ට්‍රිලිං ට්‍රිං ට්‍රිං....."

"අපොයි !!! උදේ හතත් පහුවෙලා. මම පිටත් වෙන්න හිතා හිටියෙත් උදේ හතට. දැන් ඉතින් මෙතන අස්පස් කරලා පිටත් වෙනකොට අට හමාරත් පහුවෙයි. දැන්ම වැඩ පටන් ගමු. ඉක්මනට දතකට මැදලා මූන හෝදලා පිටත් වෙන්න ඕනේ." කූඩාරම අස් කරලා මූණ හෝදගෙන ඩේවිඩ් බිම ඉඳ ගත්තේ උදේ ආහාරය ගන්න හිතාගෙනයි.

“මම කැමතියි බටර් කේක්, රාස්බෙරි, මාමලේඩ් හා පොල් කේක් ඇතුලත් වුණ උදේ ආහාරයකට” යැයි සිතා බටර් කේක්, රාස්බෙරි, මාමලේඩ් තණබිස්ස මත තබා ඩේවිඩ් ගියේ තම අත් කරත්තේ වෙනත් මල්ලක රැගෙන විත් තිබූ ජේන්ගේ ආහාර මල්ල වෙතටයි. ඉන් පොල් කේක් කිහිපයක් පිටතට ගත් ඔහු බිම තබා තිබූ අනෙක් කෑම බීම වෙතට ගියා.

“ දැන් ඉතින් කන්න තමයි තියෙන්නේ. ආ….කෝ මෙතන තියලා තිබුණු රාස්බෙරි ටික? මට මතකයි මම ඒවා මෙතන තිබ්බා කියලා. උභතෝකෝටික ප්‍රශ්නයකට මැදිවූ ඩේවිඩ් තනිවම කල්පනා කළා.

“ හිකි හිකි හි හී…. අමුතු කෙනෙක් තමයි මේ ඇවිල්ලා ඉන්නේ. රාස්බෙරි ටිකක් ගත්තා කියලා මුකුත් වෙන්නේ නැහැනේ.”

“ඔව් ඔව්.. ඒකනම් ඇත්ත තමයි. පො…පො…පොඩ්ඩක් ඉන්න.ක..ක..කවුද ඒ ක..කතා කළේ?” අසරණ ඩේවිඩ් ට දැන්නම් දෙලෝ රත්වෙලා.

“භූතයෙක්වත්ද???”

“හිකි හිකි හි හී” රාස්බෙරි හොරාගේ සිනහව ඩේවිඩ්ට ඇසුණා. දැන් නම් ඩේවිඩ් හොඳටම බය වෙලයි ඉන්නේ.

“ ඉක්මනට බඩු ටික පොදි බැඳගෙන මෙතනින් යන්න ඕනේ.”

අනේ පව් අසරණ ඩේවිඩ්. එයා දන්නේ නැහැ කව්ද රාස්බෙරි හොරා කියලා. ඒත් මම නම් දන්නවා. ඔයාලා දන්නවාද කවුද රාස්බෙරි හොරා කියලා? ඒ තමයි අහිංසකම අහිංසක කතා කරන වලස් පැංචා!!!. එයාගේ නම පොපී!

“ හම්මෝ….. හරිම හරි භයානකයි. ඉක්මනට නොගියොත් මට මොනවායින් මොනවා වෙයිද කියලා දන්නේ දෙයියෝ තමයි.” තමන්ටම කියාගත් ඩේවිඩ් බඩු මළු ටික අත් කරත්තයට පටවලා කූඩාරම අස්කළා. ඊටපස්සේ ඉක්මනට බඩු ටික පටවාගෙන සිතියම දිගහැර ගත්තා.

“ හ්ම්…. දැන් මං ඉන්නේ මෙතන මෙතන. එතකොට තව මට කිලෝමීටර දෙකක් විතර ඇවිදින්න තියෙනවා.

ඩේවිඩ් දිහා බලන් හිටිය පොපීට මෙන්න මෙහෙම හිතුණා. "මෙයා මොනවා කරනවද මන්දා. කෝකටත් මෙයා පිටිපස්සෙන්ම ගියොත් හොඳයි."

කොහොම හරි ඩේවිඩ් ලොකු විලෝ ගහක් ගාවට ආවා.

"මේ මොකක්ද මේ? මේ ගහේත් කතිරයක් කොටලා. ඒ උනාට මගේ සිතියමේ කතිරේ ඇඳලා තියෙන්නේ මෙතන නෙවෙයි. ඒ නිසා මට මේක අදාල නෑ." ඩේවිඩ් කියා ගත්තා.

"දැන් මං මෙතනින් යන්න ඕනේ."

" අන්න හොඳයි." පොපී නොදැනුවත්වම ඒ වචන දෙක පිටවුණා.

"හරියටම හරි පොපී." ඒ කටහඬ කාගෙද? වෙන කාගේද ඉතින් විලෝ ගහේ මීසක්!



# අමුතු කතාවක්

"මොනවා! මම මේ දකින්නේ හීනයක්ද?" ඒ ඩේවිඩ්ගේ හඬයි.

" කොහෙත්ම නැහැ. ඔබ දැන් ඉන්නේ මායාවෙන් පිරුණු මෙරිවුඩ් වනාන්තරයේ යි." පොපී කිව්වා.

" ඇත්තටම පොපී කියන්නේ ඔයා? ඒ කියන්නේ කතා කරන වලස් පැටියෙක්?" අන්ද මන්ද වූ විලාසයකින් ඩේවිඩ් ඇසුවා.

" ඔව් ඔයා මාව දන්නවා.මොකද මම තමයි රාස්බෙරි හොරා."

" ඉතින් ඔයා මගේ පස්සෙන් ආවද?"

"ඔව්. ඔයා මේ කැලෑවට අමුත්තෙක් නිසා මට හිතුණා ඔයාගේ පස්සෙන් එන්න."

"හරි. ඒක පැත්තකින් තියන්නකෝ. මට කියන්නකෝ ඔයාටයි මේ විලෝ ගසටයි ඇත්තටම කතා කරන්න පුළුවන්ද?" තවමත් තමා මේ දකින්නේ සිහිනයක්යැයි සිතා සිටින ඩේවිඩ් ඇසුවා.

" නැතුව ඉතින් මේ මං යස අගේට කතා කරන්නේ."

"එහෙම උනේ කොහොමද?"

"ඒක ලොකු කතාවක්. මට මුලින්ම ඔයා කවුද කියන්නකෝ."

" මම ඩේවිඩ් බ්‍රවුන්."

" බ්‍රවුන්…බ්‍රවුන්…බ්‍රවුන්…මට ඒ නම හොඳට අහලා පුරුදුයි. ඔයා…පීටර් බ්‍රවුන්ගේ නෑදෑයෙක්ද?" කුතුහලයෙන් පොපී එහෙම ඇහුවා.

" ඔව් එයා මගේ සීයා. ඔයා කොහොමද එයාව දන්නේ?"

"ඔයා දන්නව……අපොයි දෙවියනේ ! ඔහොම ඉන්න N.D නවතින්න."ඔවුන් ගේ හිසට ඉහළින් වූ අත්තක වසා සිටි විශාල මැකෝ ගිරවෙකු ඇතට පියඹා යනු දුටු පොපී කෑගැසුවා.

"ඇයි ඇයි මොකක්ද ප්‍රශ්නේ?" කලබල වූ ඩේවිඩ් ඇසුවා.

" මොකක්ද ප්‍රශ්නය කියලත් අහනවා. එයා N.D .ඔයා මෙහෙට ආවා කියලා වගේම ඔයා පීටර් බ්‍රවුන්ගේ නෑදෑයෙක් කියලා N.D දැනගත්තා දැන් ඔයාට මේ කැලෑවේ ඉන්න පුළුවන් වෙයිද කියලා දන්නේ දෙයියෝ තමයි."

"ඔහොම ඉන්න මට කියන්න කවුද N.D? අනික ඒ නමේ තේරුම මොකක්ද?"ඩේවිඩ් ට පිස්සු හැදෙන්න ලන්වෙලා කියලා ඩේවිඩ්ටම හිතුණා.

"අයියෝ ඔයාට තේරෙන්නේ නැද්ද අනේ? N.D කියන්නේ News Distributor (ප්‍රවෘත්ති සපයන්නා). ප්‍රවෘත්ති කිව්වට ඉතින් වැඩි හරියක් ඕපාදූප තමයි. දැන් මෙයා කෙලින්ම යන්නේ කැලෑ පත්තර මුද්‍රණ ශාලාවට අද හවස් වෙද්දි මුළු මෙරිවුඩ් වනයම ඔයා ආවා කියලා දැනගනියි. ආ මට අමතක වුණා කියන්න ඔයා ආව එක ගැන මට හරිම සතුටුයි." පොපී කිව්වා.

"ඔයා කියන මොනවත් මට තේරෙන්නේ නැහැ නේ." ඩේවිඩ්ගේ ඔලුව හරියට නිකන් පැටලුණු නූල් බෝලයක් වගේ වෙලා.

"හරි ඔයා එන්නකෝ මගේ ගෙදරට. අපි එහෙට ගිහිල්ලම කතා කරමු."

" නෝනේ මේ කවුද දන්නවද? මේ තමයි පීටර් බ්‍රවුන්ගේ මුණුබුරා ඩේවිඩ් බ්‍රවුන්." විශාල ඕක් ගසක් සිදුරු කර අලංකාරවත් ලෙස නිමැවූ නිවසක් තුළට පිවිසෙමින් පොපී කීවා.

"අනේ මගේ දෙවියනේ ! හඳුනා ගැනීම සතුටක්." පොපීගේ බිරිඳ ඩේවිඩ්ට අත දිගු කළා.

"ඔබ හමුවීම මටත් සතුටක් මැතිණිය." ඇගේ අත අල්ලා ආචාර කිරීමට දෙකට නැමෙන ගමන් ඩේවිඩ් කිව්වා.

" හරි නෝනේ අපි දෙන්නට උණු කෝපි එකක් ගෙනාවනම්." බිරිඳට එසේ පැවසූ පොපී "එන්න ඇවිත් වාඩිවෙන්න. " යැයි ඩේවිඩ්ට කීවා.



"මට නම් හිතාගන්නවත් බෑ ඔයා මේ මොනවද දන්නෙ නෑ කිව්වාහම. මේකයි කතාව මීට අවුරුදු විස්සකට තිහකට කලින් මේ කැලෑවට පීටර් බ්‍රවුන් කියලා කෙනෙක් ආවා. එතකොට මම ඉපදිලාවත් නෑ. ඉතින් ඊට පස්සේ……." පොපී ඉතුරු ටික සම්පූර්ණ කරන්නත් කලින්,

" ඉතින්, ඉතින් , ඊට පස්සෙ ?" ඩේවිඩ් ඇහුවා.

" පොඩ්ඩක් ඉන්න අනේ රස කරලා කියනකල්" බොරු තරහ මූණක් මවාගත් පොපී නැවතත් උද්යෝගිමත් කටහඬින් කතාව කියන්නට වුණා.

" ඔව් ඔයා දන්නවද ඔයාගේ සීයා ටිකක් නපුරු කෙනෙක්. නමුත් අන්තිම කාලේ එයා හොඳ කෙනෙක් වුණා. එයා මොන විදියකින් හරි මේ අපේ මෙරිවුඩ් වනය සොයාගත්තා. මං හිතන්නේ අහම්බෙන් වෙන්න ඇති. මොකද ඒ වෙනකොට අපි ගැන දැනන් හිටියේ අහසේ පියාඹන කුරුල්ලෝ විතරයි. මං ඔයාට කිව්වා වගේ මෙරිවුඩ් වනය මායා වනයක්. ඉතින් අපේ, ඒ කියන්නේ මේ කැලෑවේ ඉන්න මායා සතුන්ගේ, මායා බලය, මේ කැලෑවේ, ප්‍රාණය, සුන්දරත්වය කියන හැම දෙයක්ම රඳා පැවතුණේ එක දෙයක් මත. ඒ තමයි අපේ මුතුන් මිත්තන් නිපදවූ රත්තරන් මායා ඇපල් ගෙඩිය."

"ඔයාගේ සීයා ඒ ඇපල් ගෙඩිය හොරකම් කළා. ඒ වෙලාවේ අපි හැමෝගෙම මායා බලයන් නැතිවුණා. හැබැයි කටහඬ නැති වුණේ නම් නෑ. ගහ කොළ ඔක්කොම මැලවිලා ගියා. අපේ කැලෑවේ තිබූ සුන්දරත්වය නැති වී ගියා. ඉතින් අපිට සහ අපේ කැලේට අධිපති සුරංගනාවිය වෙතට අපි ගියා. අපි හැමෝම එකතුවෙලා මේ වෙලා තියෙන නස්පැත්තිය ගැන දන්වා සංදේශයක් ලියා කැලේ තැපැල් මධ්‍යස්ථානයේ සිටි තැපැල් ගිරාට සංදේශය භාර දුන්නා. ඔහු එය පීටර් වෙත ගෙන ගියා. එවිට අපට දැනගන්නට ලැබුණේ, වී ඇති විනාශය ගැන ඔහු දුක් වෙන බවත් තමන් හදිසි අනතුරකට භාජනය වීම නිසා ඒමට නොහැකි බවත් තමන් රෝහල් ගතවී සිටින බවත් කවදා හෝ දිනක ඒ ඇපල් ගෙඩිය නැවත අපට ලැබෙන බවත් ඇපල් ගෙඩිය මෙරිවුඩ් වනයේ ම තිබෙනවා කියලයි. අන්තිම කොටස් නම් පරස්පර විරෝධී නේද? කියන්න අමතක නම් වුණා, එයා කියලා තියෙනවා තමන්ගේ පරම්පරාවේම කෙනෙක් තමයි මේ ඇපල් ගෙඩිය හොයලා දෙන්නේ කියලා." පොපී කතාව නිමකළා.

"ම්ම්ම්….. ඇත්තටම හරිම අමුතු කතාවක්. ඔයා කිව්වා නේද ඇපල් ගෙඩිය නැතිවුන නිසා කැලේ මැළවුනා කියලා? එතකොට කොහොමද මේ මෙරිවුඩ් වනය මෙච්චර ලස්සන වුණේ?" කුතුහලයෙන් පිරුණු ඩේවිඩ් පොපීගෙන් ඇහුවා.

" මහත්වරුනි, කතාවට බාධා කළා නම් සමාවෙන්න. මෙන්න උණු කෝපි සමඟ ඉඟුරු බිස්කෝතු." පොපී ගේ බිරිඳ කෝපි බන්දේසියක් ගෙන එමින් කිව්වා.

“ බොහොම ස්තුතියි මහත්මිය. ඔබ හරිම කරුණාවන්ත බව පේනවා.” ඩේවිඩ් කිව්වා.

“ ස්තුතියි.”එසේ පැවසූ ඇය බන්දේසියත් සමඟ නැවත මුළුතැන්ගෙය වෙත පිය නැගුවා.

“ හොඳයි දැන් මේකයි වුණේ. අපේ කැලෑවේ සුන්දරත්වය නැතිවීම ගැන අපි හැමෝම දුක් වුණා. අවසානයේ අපේ කැලෑවට අධිපති මෙරීනා සුරඟන තීරණය කළා ඔයා අපිව හොයාගෙන එනකම් රත්තරන් ඇපල් ගෙඩියක් හදන්න. ඒකට එයාගේ බලයන් යොදවන්න වුණා. අන්තිමට ඇත්තම එක තරම් බලවත් නැති පුංචි ඇපල් ගෙඩියක් හදන්න මෙරීනා සුරඟන ට පුළුවන් වුණා. නමුත් මෙරීනා කලින්ට වඩා දුර්වල වුණා. ඒ වගේම ඒ ඇපල් ගෙඩිය නිසා අපේ කැලෑව ට ඉස්සර තරම් නොවුනත් සාමාන්‍ය තරමක ලස්සනක් ලබා ගන්න පුළුවන් වුණා. ඉතින් ඔයා මෙරිවුඩ් වනය සොයාගෙන ආවේ මේ කතාව දැනගෙන නෙමෙයිනේ. මට කියන්නකෝ මොකටද ඔයා මෙහෙට ආවේ කියලා.” පොපී කිව්වා.

“ හරි ඉන්න මං කියන්නම්. අපේ සීයගෙන් මට ලැබුණා නිදන් ගැන කියැවෙන පොතක්. මම ඒ පොත කියවනකොට ඒකෙ තිබිලා මට සිතියමක් හම්බවුණා. මේ තියෙන්නේ ඒ සිතියම. සිතියමේ එක තැනක කතිරයක් සහ නිදන් පෙට්ටියක් ඇඳලා තියෙනවා. මම නිදන් හොයන කෙනෙක් නිසා මම සිතියම දිගේ ආවා. සිතියම අනුව එනකොට තමයි මමත් මේ කැලෑව ගැන දැනගත්තේ.” ඩේවිඩ් කියාගෙන ගියා.

“ මොකක්…?සිතියම!!! ඕහ් එන්න අපි ඉක්මනට මෙරීනා සුරඟන ළඟට යන්න ඕන.”

# හෝඩුවාව

" ඇයි මොකද වුණේ?"

"යන ගමන් කියන්නම්…නෝනේ මම බ්‍රවුන් එක්ක මෙරීනා ගාවට ගිහින් එන්නම්." යැයි කෑ ගැසූ පොපී ඩේවිඩ්වත් ඇදගෙන ගෙයින් එළියට බැස්සා.

"එතකොට මගේ මලු ටික?"

"ඒවා තියලා එන්න. සිතියම විතරක් අරන් එන්න." පොපී කිව්වා.

" හරි දැන් මට කියන්න මොකක්ද වුණේ  කියලා" පොපී පසුපස දුවමින් ඩේවිඩ් ඇහුවා.

" අහන්න සිතියමේ ලකුණු කරලා තිබ්බේ මාලිගාව ඉස්සරහ තියෙන ගල් පර්වතය. යන්න කලින් පීටර් එතන හෝඩුවාවක් තියලා තිබ්බා. ඒකයි මේ සිතියමයි සම්බන්ධයි කියලා මට හිතෙනවා." පොපී කිව්වා.

" හ්ම්…..මේ බලන්න මේ ගස්වල පත්තර පිටු අලවලා." ඩේවිඩ් කීවා.

" මං හිතුවා.  N.D හරිම ඉක්මන් නේද?"

" හ්ම් මොකක්ද ඒ ලියලා තියෙන්නේ? 'ඇපල් සොයා එයි. මෙරිවුඩ් යළි පිබිදෙයි.' අපූරු කැලෑ පත්තරයක්."

" ඕවා බල බලා ඉඳලා හරියන්නේ නෑ අනේ. අපි ඉක්මනට යමු." කැලෑ පත්තර කියවන්න නැවතුනු ඩේවිඩ්ව ඇදගෙන යමින් පොපී කිව්වා.

"අර ජේන ගල් පර්වතය ගැනද ඔයා කියන්නේ?"

"ඔව් අපි මුලින්ම මෙරීනා සුරඟන ගාවට යමු." පොපී කිව්වා.

"හොඳයි…"

"මට සුරංගනාවිය හමුවීමට අවශ්‍යයි"

"ඔතනම ඉන්න." දොරටුව අසල සිටි නිල් පැහැති කුඩා සුරඟන එසේ පවසා මාලිගාව ඇතුලට පියඹා ගියා.

"ඔව් ඔයාලට ඇතුලට යන්න පුළුවන්. මෙරීනා සුරඟන ඔබ එනතුරු රැඳී සිටිනවා." ටික වේලාවකින් නැවතත් පියඹා ආ නිල් පැහැ කුඩා සුරඟන එසේ පැවසුවා.

ඩේවිඩ්ව ඇදගෙන පොපී මාලිගාව තුළට ගියා.

“සුරංගනාවියනි, මේ ඉන්නේ ඩේවිඩ් බ්‍රවුන් පීටර් බ්‍රවුන් ගේ මුණුපුරා.” පොපීගේ වචන ඔහුගේ මුවින් පිට වෙනවාත් එක්කම දුර්වල පෙනුමක් තිබූ මෙරීනා ඇගේ පුටුවෙන් නැගිට්ටා.

“මොනවා!!!!අන්තිමට ඔබ ආවා!!!”

“ ඔව් උත්තමාවියනී.” ඩේවිඩ් සම්පූර්ණ කතාව ම නැවත කිව්වා.

“හොඳයි. එන්න මාත් එක්ක. අපි ගල් පර්වතේ තියෙන හෝඩුවාව වෙතට යමු.” සුරංගනාවිය ඔවුන්ව මාලිගාව ඉදිරියේ තිබෙන ගල් පර්වතය වෙතට ගෙන ගියා.

**“ සිතියම බැලුවොත් ඇපල් ලැබෙයි”**

“ ආ..මේ කතාවේ තේරුම මොකක්ද?” ඩේවිඩ් ඇසුවා.

“සමහරවිට ඇපල් ගෙඩිය තියන තැන ගැන හෝඩුවාවක් සිතියමේ තියෙන්න පුළුවන්.”පොපී කිව්වා.

“ හොඳයි ඉන්න මම පරීක්ෂා කරනකල්.”ඩේවිඩ් කිව්වා.

“ මේකේ අකුරුයි මේ කැලෑවයි ඇර වෙන මොනවත් නෑනේ?”

“ආහ්…. මෙන්න හම්බවුණා. මේ බලන්න මේ සිතියම හදලා තියෙන්නේ කොළ දෙකක් අලවලා.”

“ඒ කිව්වේ?” ඒ සුරංගනාවියයි.

“බලන්න.කොළ දෙකක් එක උඩ එක තියලා අලවලා එක පැත්තක මේ සිතියම ඇඳලා තියෙන්නේ. සමහරවිට මේක ඇතුළේ මොනවා හරි තියෙන්න පුළුවන්.” එසේ පැවසූ ඩේවිඩ් එකට අලවා තිබූ කොළ දෙක ගලවන්න පටන් ගත්තා.

“ දෙවියනේ!!!” තුන් දෙනාටම එක පාරටම එහෙම කියවුනා. ඇතුළේ තිබුණු දේ දැකලා.මොකක්ද දන්නවද ඒ?

“ අලුත් සිතියමක්!!”

# අලුත් සිතියමක්

" එන්න අපි මාලිගාව ඇතුලට යමු." සිතියම අතට ගත් ඩේවිඩ් දෙස බැලූ මෙරීනා එහෙම කිව්වා.

මාලිගාව තුළට ගිය ඔවුන් කුඩා මේසයක් වටා ඉඳගෙන සිතියම මේසේ උඩ තැබුවා.



" මේ සිතියමේ පෙන්වන තැන මම නම් දන්නේ නැහැ. ඔයාලා නම් දන්නවා ඇති."ඩේවිඩ් කිව්වා.

" ඔව්" මෙරීනා සහ පොපී එක්වරම පැවසුවා.

" මේ තියෙන්නේ රාජකීය උද්‍යානය."පොපී කිව්වා.

"එතකොට මං හිතන්නේ, මේ කතිරෙන් පෙන්වන්නේ අපේ පවුල් ගස." "ඒ කිව්වේ ඒ ගසේ අතුවල රාජකීය පවුලේ හැමෝම අත්සන් කරනවා. ඒ වගේම එයාලා මොනවා හරි වැදගත් දෙයක් මේ ගසේ ලියනවා. හැබැයි ඒවා බලන්න පුළුවන් මන්තරේ මම විතරයි දන්නේ." ඩේවිඩ් ගේ ප්‍රශ්නාර්ථයක් සලකුණු වූ මුහුණ දෙස බලා ගෙන මෙරීනා කිව්වා.

" අපි ඉක්මනට එතැනට යමු." ඩේවිඩ් කිව්වා.

"නවතින්න පොපී, පයින් යනවට වඩා ඉක්මනට යන්න පුළුවන් කුරුලු ප්‍රවාහන සේවයට කතා කළොත්." පොපී දුවන්නට සැරසෙන දුටු මෙරීනා සුරඟන එහෙම කිව්වා.

"හොඳමයි උත්තමාවිය."

එක්වරම ඉතා සුන්දර කුරුළු නාදයක් තම දෙතොල් උල්කර පිටකළ සුරඟන දෙස ඩේවිඩ් පුදුමයෙන් බලා සිටියා. විනාඩි කිහිපයකින් විශාල ෆීනික්ස් කුරුල්ලන් තිදෙනෙක් ඔවුන් සිටි තැනට පැමිණියා. එක කුරුල්ලෙක් ඩේවිඩ් අසළටත් තවත් කුරුල්ලෙක් පොපී අසළටත් සුන්දරතම කුරුල්ලා මෙරීනා අසළටත් පැමිණියා.

"කොහොමද? ඔයාලාගේ රටටත් වැඩිය අපේ ගුවන් ගමන් සේවය ඉක්මන් නේද?" සුන්දර සිනාවක් දෙතොලට නඟා ගනිමින් මෙරීනා සුරඟන ඇසුවා.

"ඒකනම් ඇත්ත තමයි. දැන් අපි මෙයාලගේ පිට උඩ නගින්න ඕනෙද?" බිය මුසු කටහඬකින් ඩේවිඩ් ඇසුවා.

" නැතුව ඉතින්,ඔයා කියන්නේ මෙයාලගේ කකුල් වල එල්ලිලා යමු කියලද?" සිනාසෙමින් පොපී ඇසුවා. සියල්ලෝම ඔහුගේ කතාවට සිනාසුනු අතර කුරුල්ලන්ගේ පිට උඩ නැඟුනා.

" ඔන්න එහෙනම් අපි යනවා."

"ඒ කවුද ඒ?" ඩේවිඩ් ඇසුවා.

"වෙන කවුද අනේ, අපේ මේ කුරුලු හාමිලා මිසක්. අපේ කැලෑවේ ඉන්න කුඩා කූඹියාටත් කතා කරන්න පුළුවන්." වළාකුළු තුළින් පොළොව දෙස බලමින් සුරංගනාව පිළිතුරු දුන්නා.

" හොඳයි.... ඔයාලගේ කැලේ මොනතරම් ලස්සනද?"

" හ්ම්...තව ටිකකින් ඔයාට මීට වඩා ලස්සන කැලයක් දකින්න පුළුවන් වෙයි."පොපී කිව්වා.



# රත්තරන් ඇපල් ගෙඩිය

එක්වරම ෆීනික්ස් කුරුල්ලන් පහලට පියඹා ගියා."ඕන්න අපි දැන් ගොඩ බහින්නයි යන්නේ" කුරුලු හාමිලා එසේ පැවසුවා.

"දැක්කද? එයාලා දන්නවා ගොඩ බසින්න ඕනේ තැන." සුරංගනාවිය ආඩම්බරයෙන් කීවා.

"හ්ම්..හරිම ලස්සනයිනේ…අර තියෙන්නේ පවුල් ගසද?"ඩේවිඩ් ඇසුවා.

" ඒ ගසේ ලස්සන පේන්නේ ලියලා තියෙන දේවල් දැක්කම තමයි. ඉන්නකෝ පෙන්වනකම්…"යැයි පැවසූ මෙරීනා මන්තරයක් මැතිරුවා. එක්වරම පවුල් ගසේ ලියා තිබූ දෑ රත්රන් පාට අකුරු වලින් පෙනෙන්නට වුණා.

" මේ බලන්න, මෙතන මගේ අම්මා ලියලා තියෙන දේ.."

**'ප.ලි: විනාශයක් අත ළඟම එයි. ළඟපාතම ඇත'**

"ඔයාගේ අම්මා අදහස් කලේ මේ ගැන වෙන්න ඇති. ඒත් එයා කොහොමද ඒක දැනගත්තේ?" ඩේවිඩ් ඇසුවා.

" මං දන්නවා. එයාට පුළුවන් වුණා අනාවැකි කියන්න. එතකොට…මං හිතන්නේ **'ළඟ පාතම ඇත'** කියලා කියන්නේ……." සුරංගනාවියගේ වැකියේ අවසාන කොටස තිදෙනාම එක්වී පිරෙව්වා.

" රත්තරන් ඇපල් ගෙඩිය!!!"

" හොයමු හොයමු, වටේම හොයමු."ඩේවිඩ් කිව්වා.

" මේ බලන්න, මෙතන තියෙන ගල උඩ පුංචි කතිරයක් ඇඳලා!' විනාඩි කිහිපයකට පසු පොපී කෑගැසුවා.

" එන්න ඉක්මනට. ඒ කතිරේ ගොඩක් පුංචියට ඇඳලා තියෙන්නේ කාටවත් පේන්නෙ නැති වෙන්න." පවුල් ගස අසලම තිබූ ගලක කොටා තිබූ කුඩා කතිරයක් පෙන්වමින් පොපී කිව්වා.

"සමහරවිට ඇපල් ගෙඩිය ඇත්තේ මේ ගලට යටින් වෙන්න ඇති." ඩේවිඩ් කිව්වා.

"එන්න පොපී. අපි මේ ගල උස්සමු." පොපී හා ඩේවිඩ් එක්වී ගල ඔසවා පැත්තකට දැම්මා.

" මෙන්න පෙට්ටියක්."ගලට යටින් තිබූ පසේ වලක් කපා, වළදමා තිබූ කුඩා පෙට්ටියක් පෙන්වමින් ඩේවිඩ් කිව්වා.ඔවුන් ඉතා සතුටින් පෙට්ටිය ගොඩ ගත්තා.

" මට නම් ඉවසිල්ලක් නෑ."මෙරීනා කිව්වා.

“ මේකේ අගුල අරින්න හරිම අමාරුයිනේ.”පෙට්ටියට දමා තිබූ අගුල අරින්න උත්සාහ කරමින් ඩේවිඩ් කිව්වා.

“ පොඩ්ඩක් ඉන්න.” යැයි පැවසූ සුරංගනාවිය අත්පුඩියක් ගැසුවා. එක් වරම එහි ප්‍රාදූර්භූත වූ කුරුමිට්ටන් දෙදෙනා දුටු ඩේවිඩ්ට කෑගැසුණා.

“ හෑ....මේ මොක්කුද මේ?”

“ කලබල වෙන්න එපා ඩේවිඩ්. මෙයාලා තමයි මගේ උද්‍යානය පාලනය කරන්නේ. පාලකයිනි, මට නියනක් ගෙනත් දෙන්න”.

“හොඳමයි උත්තමාවිය” යැයි පැවසූ ඔවුන් අතුරුදහන් වූ අතර මොහොතකින් පෙනී සිටියේ නියනක්ද අතැතිවයි.

“ බොහොම ස්තූතියි. දැන් ඔයාලට යන්න පුළුවන්.”

හිසනමා ආචාර කළ ඔවුන් ‘පොප්’හඬක් නංවමින් අතුරුදහන් වුණා.

“මෙන්න ඩේවිඩ්.” යැයි කියූ මෙරීනා නියන ඩේවිඩ් අතට දුන්නා. ඩේවිඩ් හා පොපී එක්ව යකඩ පෙට්ටිය විවෘත කළා. එක්වරම මුළු පරිසරයම රත්තරන් පාටින් ආලෝකමත් වුණා.

“මේ තියෙන්නේ රත්තරන් ඇපල් ගෙඩිය” මොහොතකට කතා කිරීමට පවා නොහැකිවූ මෙරීනා සුරඟන තවමත් ගල් ගැසී බලා සිටින දෙදෙනාට කීවා.

“ඇත්තටම.... ඒක හරිම ලස්සනයි.” ඩේවිඩ් කිව්වා.

“ අපි ඉක්මනට මේක විලෝගහ ගාවට අරගෙන යමු.” පොපී කිව්වා.

# විලෝ ගස

"විලෝ ගස?" ඬේවිඩ් ඇසුවා.

"ඔව්, ඔව්, ඇයි ඇනේ ඔයා අර කතිරයක් ගහලා තිබ්බ විලෝ ගසක් දැක්කේ.මතක නැද්ද?" පොපී ඇහුවා.

"හරි, හරි, එතනටද මේක අරන් යන්න ඕනේ?"

" ඔව්, ඔව්, අපි ඉක්මනට යමු... මගේ ආදරණීය ෆීනික්ස් කුරුල්ලනි, අපි විලෝ ගහ ගාවට යමු."මෙරීනා සුරඟන කිව්වා.

"එහෙමයි උත්තමාවියනි, සුළු මොහොතකින් අපේ මේ මෙරිවුඩ් වනය තවත් සුන්දර වෙනවා දකිනකල් අපිට ඉවසිල්ලක් නෑ."සුන්දරතම හා විශාලතම ෆීනික්ස් කුරුල්ලා මෙරීනාට පිළිතුරු දුන්නා.

"ඔව්, ඔව්, අපි ඉක්මනට යමු." මෙරීනා සුරඟන කිව්වා.ෆීනික්ස් කුරුල්ලන් තිදෙනා තම වේගය වැඩි කළා.

මොහොතකින් ඔවුන් පැරණි විලෝ ගස අසලට පැමිණියා. මෙරීනා සුරඟන රත්තරන් ඇපල් ගෙඩිය රැගෙන විලෝ ගස අසලට ගියා.

"ඔන්න බලාගන්න අරුම පුදුම මායාව."ඇය කිව්වා.

"හොඳා...යි" ඒ ඬේවිඩ්ගේ හඬයි.



"ආදරණීය විලෝ ගස, දැන් ඔයාට ආයෙමත් තරුණ වෙන්න පුළුවන්."මෙරීනා විලෝ ගසට කතා කළා.

" ඇත්තටම! ඒ කියන්නේ රත්තරන් ඇපල් ගෙඩිය හොයාගත්තාද?" විලෝ ගස උනන්දුවෙන් ඇසුවා.

"ඇත්තෙන්ම ඔව්! දැන් අපිට ඉඩ දෙනවාද මේක ආයෙමත් තැන්පත් කරන්න?"ඇය ඇසුවා.

" නැතුව,නැතුව ..."විලෝ ගස කිව්වා. මෙරීනා සුරඟන විලෝ ගසේ කොටා තිබූ කතිරය ස්පර්ශ කළා. එවිට ගස මැදින් කුඩා කුටීරයක් විවර වුණා. සැබෑ රත්තරන් ඇපල් ගෙඩිය තරම් අලංකාර නැති කුඩා ඇපල් ගෙඩියක් එම කුටීරය තුළ තිබුණා.

" ආහ්...හරි හරි දැන් තමයි මට තේරුණේ." මෙතෙක් වෙලා අන්දමන්ද වී බලා සිටි ඩේවිඩ් කිව්වා. මෙරීනා සුරඟන කුටීරය තුළ වූ ඇපල් ගෙඩිය පිටතට ගත්තා. ඉන් පසුව සැබෑ රත්තරන් ඇපල් ගෙඩිය එතුළින් තැබුවා. එවිටම එම කුටීරය වැසී ගියා. මෙරිවුඩ් වනයේ තිබූ ගස් වැල් සියල්ල දිලිසෙන්නට වුණා.

මෙරීනා සුරඟන අහසට එසවුනා. ඇය රත්තරන් පැහැයෙන් දිලිසෙන්නට වුණා. මොහොතකින් ඇය නැවතත් පුදුමයෙන් දෑස් මහත් කරගෙන බලා සිටි ඩේවිඩ් හා පොපී අසලට පාවී ආවා.

"ඔබතුමිය  ඇත්තෙන්ම ඉතාමත් සුන්දර, තරුණ සුරඟනක් බවට නැවතත් පත්වෙලා." පොපී කිව්වා.

"මෙරීනා සුරඟන, ඔබ මේ තරම් ලස්සන බව මම දැනන් හිටියේ නැහැනේ." ඩේවිඩ් පුදුමයෙන් කිව්වා.

"ස්තුතියි ඔයාලට. ඔයාලා තමයි මේ අරුම පුදුම මායාව කළේ. බලන්න, දැන් මෙරිවුඩ් වනය කොතරම් ලස්සනයිද?" මෙරීනා සුරඟන සතුට මුසු ස්වරයකින් කිව්වා.

ඇත්තෙන්ම ඒ වන විට පැරණි ලෙස පෙනුණු ගස් තරුණ ලෙස පෙනෙන්නට වුණා. ඒවායේ තිබූ එළවළු හා පළතුරු දිලිසුනා. ඉතාමත් අලංකාර ව පිපී තිබූ විවිධ වර්ගයේ මල්වල පැහැය තවත් දීප්තිමත් වුණා. පොකුණුවල ජලය දිලිසෙන නිල්පාටින් බැබලුණා.

"මෙරිවුඩ් වනය තමයි මම දැකපු ලස්සනම වනාන්තරය. මෙරීනා සුරඟන මගේ නංගි හා ඇගේ මිතුරිය මෙරිවුඩ් වනයේ සුන්දරත්වය පෙන්වන්න එක්කරගෙන ආවාට කමක් නැද්ද?"

"අපොයි කමක් නෑ. මේ කරපු උදව්වට කොහොම ස්තුති කරන්නද කියලා මට හිතාගන්න බැහැ. මම හිතුවා මේ පුංචි රත්තරන් ඇපල් ගෙඩිය ඔයාට තෑගි කරන්න" මෙරීනා

සුරඟන ඩේවිඩ් ට කිව්වා.

“බොහොම ස්තූතියි ඔබතුමියට.” කුඩා රත්තරන් ඇපල් ගෙඩිය අතට ගනිමින් ඩේවිඩ් කිව්වා.

“අමතක කරන්න එපා ඔයයි ඔයාගේ නංගිලායි මෙරිවුඩ් වනයට ආවාම අපිට කතා කරන්න. එතකොට ඔයාලාට පුළුවන් අහසිනුත් මෙරිවුඩ් වනය වටේ රවුමක් යන්න.” සුන්දරතම ෆීනික්ස් කුරුල්ලා පැවසුවා.

“ඇත්තෙන්ම ඔයාලා හැමෝම බලන්න මම ආයෙත් එනවා.” ඩේවිඩ් කුඩා ඇපල් ගෙඩිය රැගෙන ෆීනික්ස් කුරුල්ලෙකුගේ පිටේ නැගී මෙරිවුඩ් වනය හා නගරය වෙන් කරන මායිමට ආවා. ඉන්පසු ඩේවිඩ් තනිවම ඇපල් ගෙඩියත් රැගෙන ජේන් හා කැත්ලීන්ගේ නිවස බලා පිටත් වුණා.



# අවසානය

" ජේන්, ජේන්, මෙන්න අයියා ඇවිල්ලා!!" මිදුලේ මල් පාත්තිවලට වතුර දමමින් සිටි කැත්ලීන් ඩේවිඩ්ව දැක බෙරිහන් දුන්නා.

"මොකක්.... අයියා ආවාද? මුළුතැන්ගෙයි සිට ජේන් තමන් ඇඳ සිටි ඒප්‍රණයෙන් අත පිස දමමින් දිව ආවා.

"මම කේක් එකක් හදමින් හිටියේ.බොරු නේද කියන්නේ ඔයා?"ජේන් ඇසුවා.

"නෑ නෑ අනේ, අර බලන්නකෝ.... ඔයාගේ අයියා නෙමෙයිද අර එන්නේ?" කැත්ලීන් ඇසුවා.

" ආහ්...අනේ අයියා....ඔයා ඇවිල්ලා." පුංචි ළමයෙක් මෙන් දිව ආ ජේන් ඩේවිඩ් ගේ කරේ එල්ලුණා.

"අනේ අනේ ජේන්, ඔයා නම් පුංචි ළමයෙක් වගේ. හරි හරි ඉතින් දැන් මං ආවනේ. මට චුට්ටක් හුස්ම ගන්න ඉඩ දෙනවද?" ඩේවිඩ් ඇසුවා.

"ඒකනේ ජේන් ඔච්චර තදට අයියා බදාගන්න එපා. ඔයා අයියාව බදාගෙන ඉන්නේ හරියට කවුරුහරි එයාව උස්සගෙන යයි කියලා වගේනේ." කැත්ලීන් සිනාසෙමින් පැවසුවා.

"හරි හරි ඉතින්. එන්නකෝ අයියේ, අපි තේ ටිකක් බොමු." ජේන් කිව්වා.

"හ්ම් යමු යමු. මට කියන්න දිගම දිග කතාවක් තියෙනවා."තම බඩු මළු ටික රැගෙන නිවසට ඇතුළු වෙමින් ඩේවිඩ් පැවසුවා.

නි.මි



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ග්‍රන්ථකතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ලා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)